## 410 සපිරි සෑම

සපිරි සෑම අසිරි සෝම මව් මරියේම පණ වැනී
සකල දෝසයෙන් නිදෝස පාරොන්හි රෝස කුසුමෙනී
තුති නමෝස්තු තුති නමෝස්තු පාරොන්හි රෝස කුසුමෙනී
තුති නමෝස්තු තුති නමෝස්තු මව් මරියේම පණ වැනී

මධුර තොල් වූ අදර ලොල් වූ මසුරතල්වූ මව්වනේ
සුනිලුපුල් වූ ඔබෙ උදුල් වූ මවෙත දෑස ලනු මැනේ
තුති නමෝස්තු තුති නමෝස්තු මවෙත දෑස ලනු මැනේ
තුති නමෝස්තු තුති නමෝස්තු මසුරතල් වූ මව්වනේ

අරුණසේම දිලෙන සෝම සැලෙන සෑම සුවදෙනා
තරු කිරුළ්ය, සඳ පතුල්ය ජෙරුසලෙම් හි මහිමෙනා
තුති නමෝස්තු තුති නමෝස්තු ජෙරුසලෙම්හි මහිමෙනා
තුති නමෝස්තු තුති නමෝස්තු සැලෙන සෑම සුවදෙනා

රුබර අම්ම පෙම කරම්ම පෙම්බර අම්ම මරියනේ
දින දිනෙන්ම නැතුව නිම්මා ජේසුගෙ දම්ම දහම්නේ
තුති නමෝස්තු තුති නමෝස්තු පෙම්බර අම්ම මරියනේ
තුති නමෝස්තු තුති නමෝස්තු රුබර අම්ම මරියනේ